චාවකච්චේරි ප්‍රදේශයේ, අලුත උපන් බිළිඳියක වළ දමා තිබියදී බේරාගත් බවට කියැවෙන සිදුවීම පිළිබඳ ලියැවෙන සති අග අරුණ ලිපිය (11/29) තුළ, "... පැහැයෙන් අඳුරු වුවත් ඈ ලඟ තරුණියක් තුළ වූ කෝමල බවත් සුන්දරත්වයත් නොඅඩුවම තිබුණි" යනුවෙන් සඳහන්ව තිබෙනු නිරීක්ෂණය කළ හැකි විණි.

අප සමාජය තුළද "කළු" නැතිනම් "අඳුරු" සමේ වර්ණය පහත්, අසුන්දර නැතිනම් කැත බවට වන ආකල්පය මුල් බැස ගෙන ඇති බවට නිදසුන් කොතෙකුත් මුණ ගැසේ. මෙය සිදුවන්නේ, "සුදු" නැතිනම් "පැහැපත්" සමේ වර්ණය වඩාත් උසස් ය යන ආකල්පය සමගිනි. සමාජය තුළත්, මාධ්‍ය තුළත් භාවිතා වන "කළු වුවත් ඇය රූමත් ය" වැනි අදහස් ඔස්සේ එම අගතිකාරී ආකල්පය තවදුරටත් ප්‍රවර්ධනය කෙරේ.

1) ඒ අනුව, ලිපියේ එන මෙම සඳහන ඔස්සේ, ශරීර වර්ණය "අඳුරු" වන්නේ නම්, සුන්දරත්වය ද "අඩු වන්නේ" ය යන අගතිකාරී ආකල්පය ගම්‍ය නොවන්නේ ද?

2) එවැනි අගතිකාරී ආකල්ප මාධ්‍ය ඔස්සේ තවදුරටත් ප්‍රවර්ධනය කිරීම පසුගාමී යැයි ඔබ නොසිතන්නේ ද?

3) එසේම, අදාළ තැනැත්තියගේ බාහිර ස්වරූපය පිළිබඳ තොරතුරු මෙම ලිපියට අදාළ වන්නේ කෙසේද?

එසේම මෙහි අදාළ සැකකාර මවගේ සම්පූර්ණ නමද සඳහන් කරනා පුවත් ලිපිය, ඒ සමගම ඇයගේ වාර්ගිකත්වයද සඳහන් කරයි.

1) ඇගේ නම සඳහන් කොට, ඉන් නොනැවතී ඇයගේ වාර්ගිකත්වයද ලිපිය තුළ සඳහන් කිරීම සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?